www.agaram.lk

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

| 09 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය | 4 ඒකකය |
|---|---|---|

## පළාත් පාලන ආයතන

### I කොටස

- **අංක 1-5 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර ලියන්න.**

01. ශ්‍රී ලංකාවේ නූතන පළාත් පාලන ආරම්භය සිදු වන්නේ කුමන යුගයේ දී ද? ......................................
02. කොළඹ, මහනුවර, ගාල්ල යන මහනගර සභා පිහිටවූ ආඥා පනත කුමක්ද? ......................................
03. ක්‍රි.ව. 1939 අංක 61 දරන ආඥා පනත මගින් පිහිට වූ පළාත් පාලන ආයතනය කුමක්ද? .......................
04. වැඩිම දිස්ත්‍රික්ක ගණනක් ඇති පළාත කුමක්ද? ......................................................................
05. මහනගර සභාවක ප්‍රධාන තනතුර කුමක් ද? ............................................................................

- **ප්‍රශ්න අංක 6-10 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

06. ප්‍රාදේශීය පාලනය පිළිබඳ සංකල්පය රාජාණ්ඩු සමයේ සිට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වී ඇත. (   )
07. නූතන පළාත් පාලන ආයතනවල විකාශනය පොළොන්නරු පාලන යුගයේ දී ආරම්භ වී ඇත. (   )
08. කසළ කළමනාකරණය පළාත් පාලන ආයතනවලින් සිදු කරන සේවාවක් නොවේ. (   )
09. පළාත් පාලන ආයතනවල සීමා නිර්ණය කිරීම ජාතික සීමා නිර්ණය කිරීමේ කමිටුවක් හරහා සිදු නොවේ. (   )
10. නිදහස ලැබීමෙන් පසු පනවන ලද පනත් මගින් පළාත් පාලන ආයතන පද්ධතියේ විවිධ වෙනස්කම් සිදු කරන ලදී. (   )

- **අංක 11-15 දක්වා දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

11. පළාත් පාලන ආයතන ක්‍රියාත්මක වන්නේ,
    (1). ප්‍රාන්ත ආණ්ඩුව යටතේ
    (2). මධ්‍යම රජය යටතේ
    (3). නගර සභා යටතේ
    (4). මහ නගර සභා යටතේ

12. පළාත් පාලන ආයතන සඳහා නියෝග පනවන්නේ,
    (1). මධ්‍යම ආණ්ඩු හා පළාත් සභාව
    (2). ප්‍රාන්ත හා මධ්‍යම රජය
    (3). නගර සභා හා මහනගර සභා
    (4). දිස්ත්‍රික් උසාවි හා ගම් උසාවි

13. වයඹ පළාතට අයත් දිස්ත්‍රික්කයකි,
    (1). බදුල්ල
    (2). කෑගල්ල
    (3). අම්පාර
    (4). පුත්තලම


agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

14. පළාත් පාලන ආයතන මූල්‍ය සම්පත් උපයා ගන්නා ආකාරයන්,

(1). ඉතිරි කිරීම් හා පොලී මුදල්
(2). ණය හා වාරික මුදල්
(3). වරිපණම් හා බදු මුදල්
(4). තැන්පත් හා පොලී මුදල්

15. ප්‍රාදේශීය විවිධත්වයට බලපාන කරුණක් නොවන්නේ,

(1). ප්‍රදේශයේ ජනතාව
(2). සම්පත්වල ව්‍යාප්තිය
(3). සංස්කෘතික විවිධත්වය
(4). භූගෝලීය පසුබිම

- **ප්‍රශ්න අංක 16-20 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.**

| | |
|---|---|
| 16. මහනගර සභාවේ ප්‍රධානියා | |
| 17. නගර සභාවේ ප්‍රධානියා | ලේකම් |
| 18. මහනගර සභාවේ පරිපාලන නිලධාරී | සභාපති |
| 19. ප්‍රාදේශීය සභාවේ පරිපාලන නිලධාරී | පුරපති |
| 20. ප්‍රාදේශීය සභාවේ ප්‍රධානියා | නාගරික කොමසාරිස් |

(20 × 02 = 40)

## II කොටස

- **පහත දී ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

01. (1). ශ්‍රී ලංකාවේ මුලින්ම ආරම්භ කළ මහනගර සභා 2 ක් ලියන්න.
(2). සබරගමුව පළාතේ දිස්ත්‍රික්ක 2 ක් ලියන්න.
(3). නිදහස ලැබීමෙන් පසු මෙරට ක්‍රියාත්මක වූ පළාත් පාලන ආයතන 2 ක් ලියන්න.
(4). 1987 න් පසු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ පළාත් පාලන ආයතන 2 ක් නම් කරන්න.
(5). පළාත් පාලන ආයතනයක නිලධාරී සැලැස්මේ දැක්වෙන අනෙකුත් නිලධාරීන් 2 ක් නම් කරන්න.
(6). 1940 දී නගර සභා පිහිට වූ ආඥා පනත කුමක්ද?

(06 × 02 = 12)

02. (1). පළාත් පාලන ආයතන පිළිබඳ නිර්වචනයක් ලියන්න. (ල.01)
(2). පළාත් පාලන ආයතන අවශ්‍ය වන්නේ ඇයි? කරුණු 2 ක් ලියන්න. (ල.02)
(3). පළාත් පාලන ආයතනයක ප්‍රධානියා සතු බලතල 4 සඳහන් කරන්න. (ල.04)
(4). පළාත් පාලන ආයතන මගින් සේවා ඉටු කිරීමේ දී එම ආයතන වෙත පැවරී ඇති බලතල 5 ක් ලියන්න. (ල.05)

03. (1). මහනගර සභාවක නාගරික කොමසාරිස් ධූරය සඳහා නිලධාරියකු පත් කරන්නේ කවුද? (ල.01)
(2). පළාත් පාලන ආයතනවල සංවිධාන ව්‍යුහයට අදාළ මූලික ලක්ෂණ 2 ක් ලියන්න. (ල.02)
(3). පළාත් පාලන ආයතනවල සීමා නිර්ණය කිරීමේදී සැලකිල්ලට ගන්නා නිර්ණායක 4 ක් ලියන්න. (ල.04)
(4). පළාත් පාලන ආයතන මූල්‍ය සම්පත් උපයා ගන්නා ආකාරය නිදසුන් දෙමින් පැහැදිලි කරන්න. (ල.05)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!


agaram.lk

04. (1). පළාත් පාලන ආයතන මගින් සපයන සේවා 5 ක් ලියන්න. (ල.05)

(2). එම ආයතනවලින් සැපයෙන වෙනත් සේවා නිදසුන් දෙමින් පැහැදිලි කරන්න. (ල.07)

05. (1). පළාත් පාලන ආයතනවල සේවා සම්බන්ධයෙන් මහජනතාව විසින් ඉටු කළ යුතු යුතුකම් 3 ලියන්න. (ල.03)

(2). එම සේවා ඉටු කිරීම සම්බන්ධයන් මහජන නියෝජිතයන්ගෙන් හා නිලධාරීන්ගෙන් ඉටුවිය යුතු වගකීම් හා යුතුකම් 2 බැගින් ලියන්න. (ල.04)

(3). ප්‍රාදේශීය අවශ්‍යතා හා සම්පත් හඳුනාගෙන ඊට ගැලපෙන ලෙස සැලසුම් කිරීම ඔස්සේ ජල සම්පාදනය හා කසළ බැහැර කිරීම යටතේ සැලසුම් සකස් කළ යුත්තේ කෙසේදැයි විස්තර කරන්න. (ල.05)

(05 × 12 = 60)

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

agaram.lk